# කෑගල්ල කලාප කාර්යාලය
# උපකාරක ප්‍රශ්ණ පත්‍රය
# 11 වන ශ්‍රේණිය 2020
# පෙරදිග සංගීතය 1 පත්‍රය

සියළුම ප්‍රශ්ණ වලට පිළිතුරු සපයන්න.

1. භෛරවී රාගයෙහි විවාදී ස්වර වන්නේ
   i. රි ග ධ නි   ii. රි ග ධ නි ම   iii. රි ග ධ නි ම   iv. <u>රි</u> <u>ග</u> ම <u>ධ</u> <u>නි</u>
2. ස්වර වලින් පමණක් නිර්මිත ප්‍රබන්ධ හඳුන්වන නම
   i. කව්වාලි ගී   ii. භජන්   iii. ලක්ෂණ ගී   iv. සර්ගම්
3. සියළු ශුද්ධ ස්වර යෙදෙන ජාතිය සම්පූර්ණව යෙදෙන වාදී සංවාදී ධ , ග ස්වර වන නිර්දේශිත රාගය වන්නේ
   i. භූපාලි   ii. යමන්   iii. බිලාවල්   iv. කාෆි
4. ප්‍රියා සූරියසෙන මහතා ගයන ''හෙට දවසේ අප දෙදෙනා'' යන ගීතයේ නාදමාලාව සඳහා යොදාගත් රාගය
   i. යමන්   ii. භූපාලි   iii. භෛරවී   iv. කාෆි
5. භූපාලි රාගයෙහි ස්වර සංගති ඇතුලත් සරල ගීතයකි
   i. මෙලොව තිබෙන අමිල නිමල   ii. කවුරුදො අර කවුළුවෙන්
   iii. සරුංගලේ වරල් සැලේ   iv. බඹරෙකු ආවයි
6. නිධ-ප / මපගම / ප-----/ පමගරි/ යනුවෙන් ස්වර පාදයක් ඇති සර්ගමය අයත් රාගය
   i. භෛරවී   ii. භූපාලි   iii. යමන්   iv. බිලාවල්
7. ප, ස ස්වර වාදි හා සංවාදී ව යෙදෙන මධ්‍යම රාත්‍රියේ ගැයීමට සුදුසු නිර්දේශිත රාගයකි
   i. යමන්   ii. භෛරවී   iii. භූපාලි   iv. කාෆි
8. සම්පූර්ණ ස්වර සප්තකයේ ස්වර ගණන
   i. 8 කි   ii. 12කි   iii. 7 කි   iv. 5කි
9. සංගීතයේ මාධ්‍ය වන්නේ
   i. නාදය යි   ii. ස්වර යි   iii. හඬ යි   iv. ගීත යි
10. ඨේකා යනු
    i. අක්ෂර වේ   ii. ස්වර වේ   iii. තබ්ලා පද වේ   iv. බෙරපද වේ
11. මේල යනු
    i. රාගයෝය   ii. ස්වර සංගතිය   iii. රාග අංගයකි   iv. රාග උපදවන ස්වර මාලාය
12. උතරු ඉන්දීය භක්ති ගී ගායනා ශෛලිය
    i. ඛ්‍යාල්   ii. ගසල්   iii. භජන්   iv. කව්වාලි

13. ශාන්ති නිකේතනයෙහි නිර්මාතෘවරයා වන්නේ

i. හරි ප්‍රසාද් චෞරසියා  ii. රවීන්ද්‍රනාත් තාගෝර්

iii. ඒ.ආර් රහුමාන්  iv. ජග් ජිත් සිංග්

14. මාත්‍රා ගණනින්  සමාන වන තාල යුගලය නම්

i. කෙහෙර්වා - ලාවණී  ii. කෙහෙර්වා - ත්‍රිතාල්

iii. දදරා - ඛෙම්ටෝ  iv. ජප් තාල් - දීප්චන්දි තාල්

15. තත්පර 1ක් තුල සිදුවන කම්පන වාර ගණන හඳුන්වන්නේ

i. තාරතාවය  ii. සංඛ්‍යානය iii. විස්තාරය  iv. ප්‍රගමණය

16. උතරු ඉන්දීය ප්‍රධාන තාල වාද්‍ය භාණ්ඩය වන්නේ

i. මෘදංගය  ii. සිතාරය  iii. තම්මැට්ටම  iv. තබ්ලාව

17. අනාසාතාත්මක මෙහෙ ගී යටතට  අයත් වන ගීත යුගලය වන්නේ

i. පතල් ගි , ගොයම් ගී  ii. පාරු ගී , බැති ගී

iii. බඹර ගී, පාරු ගී  iv. ගැල් ගී , නෙළුම් ගී

18. "රූ රැසේ අඳිනා ලෙසේ අත් ලෙලදිදී විදුලිය පබා" මෙහි සඳැස්මත් ගණන වන්නේ

i. 28  ii. 26  iii. 24  iv. 32

19. "රූ රැසේ අඳිනා ලෙසේ අත් ලෙලදිදී විදුලිය පබා" යන ගීතයට ගැලපෙන හින්දුස්ථානී තාලය වන්නේ

i. ජප්තාලය  ii. ත්‍රීතාලය  iii. දීප්චන්දි තාලය  iv. කෙහෙර්වා තාලය

20. "රූ රැසේ අඳිනා ලෙසේ අත් ලෙලදිදී විදුලිය පබා" යන  ගී පාදය ගැයීමේදී යොදාගන්නා තිත වන්නේ

i. සුළු මැදුම් දෙතිත  ii. මහ තති තිත

iii. මැදුම් මහ දෙතිත  iv. මහ මැදුම් දෙතිත

21. එම ගී පාදය අයත් කාව්‍යය වන්නේ

i.  හංස සංදේශය

ii. ලෝකෝපකාරය

iii. සැළලිහිණි  සංදේශය

iv. ගුත්තිල කාව්‍යය

22. දවුල ප්‍රධාන අවනද්ධ භාණ්ඩය ලෙස ගන්නා නර්තන සම්ප්‍රදාය වනුයේ

i. ජන ගි  ii. සබරගමු  iii. පහතරට  iv. උඩරට

23. රුක් අත්තන මල මුදුනේ යන ගීතයේ නාදමාලාව සඳහා පාදක කොට ගත් වන්නම වනුයේ

i. හනුමා වන්ම  ii. උකුසා වන්නම

iii. තිසරා  වන්නම  ivසිංදු වන්නම

24. ‘‘උරුට්ටුව’’ ‘‘තෝඩායම’’ ආදී අංග අතුලත් රංග ශෛලිය වන්නේ

i. නූර්ති ii. කෝලම් iii. සොකරි iv. නාඩගම්

25. උතුරු ඉන්දීය රාගධාරී සංගීතයේ ආභාෂය ලද රංග ශෛලිය වන්නේ

i. කෝලම් ii. නූර්ති iii. නාඩගම් iv. සොකරි

26. තත් 6 කින් යුත් වාද්‍ය භාණ්ඩයකි

i. වයලීනය ii. එස්රාජය iii. ගිටාරය iv. මැණ්ඩලීනය

27. ‘‘අන්දරයායේ වැව්තාවුල්ලේ’’ යන ගීතය ගායනා කරන ගායකයා වන්නේ

i. ඩබ්.ඩී. අමරදේව ii. කරුණාරත්න දිවුල්ගනේ

iii. කරුණාරත්න අබේසේකර iv. ටී.එම්. ජයරත්න

28. එම්.එස් ප්‍රනාන්දු ඇන්ටන් ජෝන්ස් වැනි ගායකයින් ගායනා කල ගීත වලට අදාල ගීත ශෛලිය වනුයේ

i. සරල ගී ii. ජන ගී iii. කපිරිඤ්ඤා ගී iv. නූර්ති ගී

29. F Major chord එකට අදාල ස්වර නම්

i. C E G ii. F A C iii. D F A iv. G B D

30. Major Scale එකකදී ස්වර පිහිටිය යතු පිළිවෙල වන්නේ

i. T T T ST T T ST ii. T T ST T T T ST

iii. T ST TT ST T T iv. T T ST T T ST T

31. සත් සමුදුර චිත්‍රපටයේ ඇතුලත්’’ සිනිදු සඳුමුදු තලාවේ’’ ගීතය ප්‍රබන්ධ කර ඇත්තේ

i. නාරද දිසාසේකර ii. මර්සලින් ජයකොඩි පියතුමා

iii. මහගමසේකර iv. ඩෝල්ටන් අල්විස්

32. සීගිරි ළඳකගේ මිණිමුතු පයට අනුරාපුර පොලොන්නරුව යන ගී ඇතුලත් චිත්‍රපටය

i. සත් සමුදුර ii. ගැටවරයෝ iii. හුලවාලි iv. රේඛාව

| A | B | C | D |
|---|---|---|---|
| ධාතූනා | තා තිං S | ධා ධිං ධිංධා | ධිනා |

33. මෙහි ත්‍රිතාලයට අදාල ඨේකාවේ කොටසක් ඇති ඉංග්‍රීසි අක්ෂරය වන්නේ

i. A ii. B iii. C iv. D

34. තාලයට අදාල සෑම විභාගයකම සමාන මාත්‍රා ඇති තාල 2ක කොටස් මෙහි ඇත

i. A සහ D ii. B සහ D iii. A සහ C iv. B සහ C

35. දීප්චන්දි තාලයේ කොටසක් ඇති ඉංග්‍රීසි අක්ෂරය

i. A ii. B iii. C iv. D

36. A අක්ෂරයට අදාල හින්දුස්ථානි තාලයට සමාන දේශීය තිතෙහි බෙරපදය වනුයේ

i. දොං / ජිංත / ගත / දොංත ii. දොමිකිට / කිටදොමි

iii. දොංජි / ජිංගත / ජිගත / දොංගත iv. දොංජි / ජිගත

37. නාදයේ ගුණ

i. 2 කි ii. 3 කි iii. 4 කි iv. 5 කි

38. පැස්ටෝරල් හා කෝරල් සිම්පනි කරන ලද බටහිර සිම්පනි සංගීතඥයා වන්නේ

i. මොසාර්ට් ii. යානි iii. බේතෝවන් iv. ෂුබර්ට්

39. බටහිර සංගීත භාණ්ඩ වර්ගීකරණය කොටස් කීයකට බෙදේද

i. 2 කට ii. 5 කට iii. 3 කට iv. 4 කට

40. සංගීත ප්‍රසංගයකදී ශබ්දය ග්‍රහණය කරගන්නා තාක්ෂණික උපකරණයකි

i. ස්පීකරය ii. මයික්‍රෆෝනය iii. මික්සර් ivඇම්ප්ලිෆයරය

# කෑගල්ල අධ්‍යාපන කලාපය
## උපකාරක ප්‍රශ්ණ පත්‍රය
## 11 වන ශ්‍රේණිය - 2020
## පෙරදිග සංගීතය - 11 කොටස

පලමුවන ප්‍රශ්නය අතුළු ප්‍රශ්න 5 කට පිළිතුරු සපයන්න. පළමු ප්‍රශ්ණය අනිවාර්ය වේ.

1) 1 සරිස- සරිගරිස- සරිගමගරිස- මෙම ස්වර අභ්‍යාසය භෛරවී රාගයට අනුව සකස් කරන්න

2 ''ඇගේ තරු දරුවෝ අත්ඔසවාලා'' මෙම ගී පාදය සඳහා වැයීමට සුදුසු තාලය හදුන්වා නියමිත තාල සංකේත සමඟ ප්‍රස්තාර කරන්න

3 සගසරිමග, රිමරිගපම, මෙම ස්වර රටාවේ ඊළඟ ස්වර ඛණ්ඩ 2 ලියා දක්වන්න

4 යම්කිසි රාගයක ස්වර 2 ක් වර්ජිත වේ. නිර්දේශිත එම රාගය හදුන්වා එහි ආරෝහණ හා අවරෝහන ස්වර ලියන්න.

5 ශුද්ධ ගා සහ ශුද්ධ නි ස්වර විවාදී ව යෙදෙන නිර්දේශිත රාගය .......................... යයි.

6 ''දෙපානෝ'' ගීත නාටකය හා ''හෙළ ගී මග'' යන ග්‍රන්ථ නිර්මාණය කරන ලද සංගීතඥයා වන්නේ .......................................... ශූරීන්ය

7 ගුවන් විදුලි සරළ ගී යුගය ආරම්භ වූයේ .............................වර්ෂයේය.

8 නාඩගම් රංග ශෛලිය සඳහා අභාෂය ලැබූ සංගීත සම්ප්‍රදාය වන්නේ ..................................... යයි.

9 නාදයේ ත්‍රිවිධ ගුණය ධ්වනිගුණය .......................... හා ....................... යයි.

10 තිසරා වන්නම ............................. අයත් වන අතර සිංදු වන්නම් ................ ................................ අයත් වේ.

2) පහත දැක්වෙන්නේ නිර්දේශිත රාග 3 කට අයත් ස්වර ඛණ්ඩ කීපයකි.

A) ගප ධප ධසරිස

B) ගස ධප නිධනිරිස

C) ගප ධනි සරිස

1 ඉහත A.B.C යන ස්වර ඛණ්ඩ වලට අදාල රාග පිළිවෙලින් නම් කරන්න.

2 B සහ C රාගවලට අයත් පහත සඳහන් තොරතුර සම්පූර්ණ කරන්න.

| රාගයේ නම | ආරෝහණ | අවරෝහණ | මුඛ්‍යාංගය | වාදී | සංවාදී |
|---|---|---|---|---|---|

| | ස්වර | ස්වර | | | |
|---|---|---|---|---|---|
| | | | | | |

3 A හෝ C යන රාග 2න් එකකට අයත් මධ්‍යලය ගීතයේ හෝ වාදිතයේ ස්ථායි කොටස ගීත ස්වර ප්‍රස්ථාර කරන්න

3) 1 නිර්දේශිත රාග අතුරෙන් කෝමල ස්වර 4 ම යෙදෙන රාගයේ ලක්ෂණ ගීතයේ ස්ථායී කොටස ගීත ස්වර ප්‍රස්ථාර කරන්න

2 තීව්‍ර ස්වර ඇතුලත් රාගයෙහි ස්වර අභ්‍යාසයක් උච්ච සඞ්ජය දක්වා ආරෝහණ අවරෝහණ වශයෙන් ගොඩ නගන්න

3 ශුද්ධ ස්වර යෙදෙන ඖඩව ජාතියට අයත් රාගයට තාලංකාර 2ක් ලියන්න

4) 1 ගැමි ගී සහ සේ ගී වල දැකිය හැකි සුවිශේෂී ලක්ෂණ 02 බැගින් ලියන්න

2 ආසාතාත්මක හා අනාසාතාත්මක ගී හඳුන්වා උදාහරණ සඳහා එක් වර්ගයකට එක් ගීතය බැගින් ලියන්න.

3 ජන ගි වර්ගීකරණය ගැලීම් සටහනක් මගින් දක්වන්න.

5) 1 පහත දැක්වෙන ගී වලට අදාල තාලපද නම්කරන්න

A) සෝභාව දේ මෙපුර

B) රන්මලක් ලෙස

C) රන්වන් කරල් සැලෙයි

2 ඉහත ගී පාද අතුරෙන් මාත්‍රා ¾ වශයෙන් යෙදෙන ගී පාදය අයත් තාලපදය නියමිත තාල සංඛේත යොදා ප්‍රස්ථාර කරන්න.

3 මාත්‍රා 2/3 වශයෙන් ප්රස්ථාර වන හින්දුස්ථානී තාලයට ගැලපෙන දේශීය තිත නම් කර ඊට අදාල බෙර පදයක් ප්‍රස්තාර කරන්න.

4 A ගීතයට අයත් බටහිර තාල සංකේතය(TIME SIGNATURE) නම් කරන්න.

6) 1 පහත සඳහන් සංගීතඥයින්ගෙන් සංගිත පද්ධතියට සිදුවූ සේවාව පිළිබඳව කරුණු දක්වන්න

(ඔවුන් කරන ලද නිර්මාණ, ලියන ලද ග්‍රන්ථ, ආදී වශයෙන්)

A) හරිප්‍රසාද් චෞරසියා - භාරතීය සංගීතය

B) සී.ද .එස් කුලතිලක - සිංහල සංගීතය

C) ඩබ් අමදියෙස් මෝසාර්ට් - බටහිර සංගීතය

7) පහත සඳහන් කරුණු අතුරෙන් 3ක් පිළිබඳ ව උදාහරණ සහිතව විස්තර ලියන්න.

1. පංචතූර්ය භාන්ඩ වර්ගීකරණය
2. සැඳැස්මත් හා ගීමත්
3. නූර්ති ශෛලියේ සංගීතමය ලක්ෂණ
4. ගුවන් විදුලි සරළ ගී යුගය.